

## කස්තිරම

### ඩී බී කුරුප්පු



# අපේ ගුවන් විදුලිය

ප්‍රකට ගීත රචක සුනිල් සරත් පෙරේරාගේ අප්‍රියෙල් මෙල්බර්න් දේශනයේදී ඔහු විසින් රචනා කරන ලද ''අනෝතත්ත විල නෙළුම නෙළාලා'' යන ගීතය බිහි වූ හැටි විස්තර කළ විට, මගේ සිත අතීතයට දිව ගියේය. මෙල්බර්න් ඉරිදා ප්‍රජා ගුවන් විදුලි සේවයෙන් එම ගීතය ඉදිරිපත් කරමින් නිවේදකයා කළ හැඳින්වීම වෙත මා සිත දිව ගියේ ඔහුත් එම සභාවේ සිටි නිසාය. ගීතය ගැන දීර්ඝ ප්‍රස්තාවනාවක් ඉදිරිපත් කරමින් ඔහු කීවේ, එය එරන්දතිය මහෞෂධ පණ්ඩිතයන් හමු වන්නට යාම ගැන කියන්නක් බවය.

අපේ ප්‍රධාන ගුවන් විදුලි සේවයක් ගැන කීමේදී මෙම අතීත පුවත කීම එක අතකින් විහිළුවකි. අනෙක් අතින් මාතෘකාවට හොඳ ප්‍රවේශයක් එමඟින් ලැබෙන්නේය. එදා එම නිවේදකයා කළ වරදට හේතු වූයේ ගීතයේ රචකයා සහ ගායකයා (අවශ්‍ය නම් තනු නිර්මාපකයා) සඳහන් කිරීමෙන් නොනැවතී දිග හැල්ලක් කියන්නට යාමය. එබන්දක් අසන්නාගේ වින්දනය සඳහා අවශ්‍යද නැත. හුදෙක් තමන්ගේ දැනුම ප්‍රදර්ශනය කිරීමක් පමණක් වන හෙයින් එදා වූයේ ඔහුගේ නොදන්නකම හෙළි වීම පමණකි.

අපේ ගුවන් විදුලි සේවයේ අද දක්නට ඇති මූලික දුර්වලතාවක් වූ මෙය හැඳින්වීමට තවත් ගැමි උපහැරණයක් ඉදිරිපත් කළ හැකිය. ''පන්සිල් පද පහටම පොල් තෙල් පහන ඉවර කර ගත්තා'' යයි කීමක් අපේ ගම් වල ඇත. එය ගැමියාට හුරු පුරුදු තොවිල් ඇසුරෙන් බිහි වූවකි. තොවිලය පටන් ගැනීමේදී මල් යහනේ පොල්තෙල් පහනක් දල්වා ගෙන යකැදුරා කලින්ම පන්සිල් පද කියා තෙරුවන් නමදියි. එය තොවිලයේ අවශ්‍යාංගයක් නොවෙයි. තොවිලය බුදු බණට හෝ බොදු චාරිත්‍රයට අයත් එකක් නොවෙයි. තෙරුවන් ගාවා ගැනීමෙන් කරන්නේ එයට එක්තරා මුවාවක් සපයා ගැනීමය. බෞද්ධ මුහුණුවරක් දීමය. ඒ නිසා පන්සිල් ගැනීම තොවිලයේ අංගයක් නොව හුදෙක් ප්‍රවේශයක් පමණි.

ප්‍රවේශයටම සම්පූර්ණ කාලයත්, ශක්තියත් යොදවා කාලය නාස්ති කිරීමේ නුනුවණකම අවධානය කිරීමටය, ගැමියා මෙම උපහැරණය භාවිතා කරන්නේ. අපේ ගුවන් විදුලියෙන් අද දක්නට ලැබෙන මූලික ලක්ෂණයත් එයයි. එය කෙළින්ම කීම දරුණු වැඩි යැයි කෙනෙකුට පෙනී යා හැකිය. එහෙත් ඊට වඩා ලිහිල්ව කීමට විදිහක් මට සිතා ගන්නට බැරිය.

මෙරට සිටින අපගේ ලේඛකයන්, පුවත්පත් කලාවේදීන් සහ අනෙකුත් මාධ්‍යවේදීන් ද, මව් බිමේ ප්‍රවීණයන් නොහොත් එරට සිටින තමාගේ වීරයන් අනුගමනය කරන බව නොරහසකි. එහෙත් මෙසේ වීරයන් ලෙස පෙනී සිටින බොහෝ දෙනෙකුද අර යකැදුරා කරන වැඩයම කරන බව කිව යුතුය. එයට මූලික හේතුව එක් අතකින් ඔවුන්ගේ හැකියාවද වීම කණගාටුදායකය. එක්කෝ ඔවුනට නොනවත්වා කතා කරගෙන යාමේ හැකියාවක්, වාං මාලාවක් ඇත. නැතහොත් යමක් දිගටම ලියා ගෙන යාමේ අතහුරුවක් ඇත. කියන්නේ කුමක්ද නැතහොත් ලියන්නේ කුමක්ද යන්න ප්‍රශ්නයක් නොවේ. ඔවුන් සතුව ලස්සන වචන, වගන්ති, යෙදුම් ඇත. ඒවා නොමසුරුව භාවිතා කිරීම කතාවට නැතහොත් ලේඛනයට ප්‍රමාණවත් බවත් ඔවුන් සිතන පාටය.

ගුවන් විදුලි නිවේදකයා කීමෙහි, බිණීමෙහි සමතෙකු විය යුතුය. අත පය ගසමින් කතා කරන්නාට ඒ රාජකාරිය කරන්නට බැරිය. එය එසේම නොවන බවට හොඳ උදාහරණයක් මම ඉදිරිපත් කරමි. කලකට උඩදී මෙල්බර්න්හි එස්.බී.එස් සිංහල වැඩ සටහන ඉදිරිපත් කළ එල්මෝ පෙරේරා සිංහල නොදත්තෙකැයි නොකියමි. එහෙත් අද සිටින බොහෝ නිවේදකයන් තරමට ඔහුට සිංහල සුගම නොවීය. සීමිත හැකියාවකින් වුව උපරිම ප්‍රයෝජනයක් ගෙන ඔහු ඉදිරිපත් කළේ ඉතා සාර්ථක වැඩ සටහනකි. තමාට ලැබෙන විනාඩි හැටක කාලයෙන් උපරිම ප්‍රයෝජනයක් ගත් එල්මෝ පෙරේරා, අද බොහෝ දෙනා විනාඩි හැටක (සමහර විට පැය දෙකකින්) ඉදිරිපත් කරන වැඩ සටහනට වඩා අහුපෑවතක් ඇති පූර්ණ වැඩ සටහනක් ඉදිරිපත් කරන්නට සමත් විය. සතියේ ප්‍රවෘත්ති සාරාංශයක් ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කිරීමද එහි අවශ්‍යාංගයක් විය.

කොටින්ම එල්මෝ පෙරේරාගේ වැඩ සටහනේ සක්ක ගැසීමක් නැත. දැනට වසර හත අටකට උඩදී ඒ.බී.සී. මෙල්බර්න් සේවයේ වශයෙන් මා රුචි නොකරන්නන්ගේ වුවත් වැඩ සටහන් ආසාවෙන් අසන්නට මම පුරුදු වූයෙමි.

තමන් ලබන නිළ පුහුණුවට අමතර වශයෙන්, තමන් වාසය කරන රටේ පවත්නා ගුවන් විදුලි සේවාවන් ගැන යම් අවබෝධයක් ලබා ගැනීමද අවශ්‍යම ය. මම නිතර ඒ.බී.සී වැඩ සටහන් වලට සවන් දෙන්නෙක්මි. එහි පැවැත්වෙන සම්මුඛ සාකච්ඡා නොහොත් පිළිසඳර හැමකක්ම නියමිත කාල සීමාවක් තුළ හමාර කරනු ලැබේ. අගමැති බඳු කෙනෙකු සමඟ කෙරෙන සංවාදයකදී වුව මෙම සීමාව පැන යාමක් නැත. එහෙම වුණාම වට වංගුවේ දුවන්නට බැරිය. බොරු වර්ණනා නැත. එය ලෝක ස්වභාවය යි.

මෙම මාධ්‍යවේදීන් එක්තරා පුහුණුවක් ලබන බවද මා අසා ඇත. එම පුහුණුවේ ගුණාගුණ මම නොදනිමි. මට කිව හැක්කේ මගේ කණට ඇසෙන දේ ගැන පමණි. ගත වූ පසළොස් වසරක පමණ කාලයක් තුළ හැකි හැම විටකම මම ඉරිදා උදේත්, පසුව සෙනසුරාදා උදේත් වැඩ සටහනට සවන් දී ඇත්තෙමි. මේ ගැන කතා කරන්න මට ඇති එකම සුදුසුකම එයයි. එය දියුණු වෙනු දැක්මට මගේ ඇති අවංක ආසාවත් තවත් සුදුසුකමකැයි කිව හැකිය. පුද්ගලයන්

අපේ සම්මුඛ සාකච්ඡා සමහර විට හමාර නොවන පාටක් පෙන්වයි. විටක කතා කරන්නේ අමුත්තාට වඩා නිවේදකයාය. ඔහු තමාගේ ශිල්ප දැක්වීමට එය අවසරයක් කර ගනියි. හැඳින්වීමත් බොහෝ විට අනවශ්‍ය වර්ණනාවන්ගෙන් පිරී ඇත. පසුගියදාක (වෙසක් අවදියේ විය යුතුය) මෙල්බර්න් පන්සලක හාමුදුරු නමක් සාකච්ඡාවට සහභාගී කරවා ගන්නට ගිය නිවේදකයා වැඳ වැටීගෙන, දිගින් දිගට කරන ගුණ වැනුම අම්හිරි දම් දෙසුමක තත්වයට පිරිහෙනවා මං බලාගෙනය.

සවස් වරුවේ පැය තුනක වැඩ සටහනක ඩග් එයිටන් නමැති නිවේදකයෙක් විය. දස වසරක සේවයෙන් පසු හදිසියේ තමාගේ සේවය අවසන් කරන්නට වූ දිනයේ ඔහු කතා කළ සංවේගදායක ස්වරය මට අදත් මතකය. ඔහු කී දෙයක් මා සමඟ කීවේ උපා උපදාස යැයි සිතමි. මුළු පැය තුන තුළම තමා කියන්නට යන හැම වචනයක්ම කලින් ලියා ගෙන යන බවය ඔහු අවධාරණය කොට ඇත්තේ. අත වන වනා මැදිරියට යාමක් නොවේ. එය පහසුද නොවේ. එහෙත් ඒ විදිහට සූදානම් වීමෙන් අනවශ්‍ය විදිහට වගාඩම්බර කීම හෝ සක්ක ගැසීම අවශ්‍ය වන්නේ නැත.

අපේ ප්‍රජා ගුවන් විදුලි සේවාවෙහි නිරත වන නිවේදකයන් එය ස්වෙච්ඡාවෙන් කරන බව කෘතවේදීව සඳහන් කළ යුතුය. එහෙත් "කකුල් වල කටු ඇනෙන්නේ කැලේ යන මිනිසගේ"ය කියන කතාව මෙතනටත් මතු කළ යුතුය. නිකම්ම ඉන්නා කෙනාට දොසක් අහන්නට වෙන්නේ හෝ ආ වැඩීම් වලට වෙලාවක් නැත. අමුත්තාගේ නම සහ තනතුරත් මුලදී පමණක් නොව අගදීත් සඳහන් කිරීම සම්මත පිළිවෙලයි. ඔවුන්ට ස්තුති කිරීම වචනයෙන් දෙකෙන් හමාර වෙයි.

අපේ සම්මුඛ සාකච්ඡා සමහර විට හමාර නොවන පාටක් පෙන්වයි. විටක කතා කරන්නේ අමුත්තාට වඩා නිවේදකයාය. ඔහු තමාගේ ශිල්ප දැක්වීමට එය අවසරයක් කර ගනියි. හැඳින්වීමත් බොහෝ විට අනවශ්‍ය වර්ණනාවන්ගෙන් පිරී ඇත. පසුගියදාක (වෙසක් අවදියේ විය යුතුය) මෙල්බර්න් පන්සලක හාමුදුරු නමක් සාකච්ඡාවට සහභාගී කරවා ගන්නට ගිය නිවේදකයා වැඳ වැටීගෙන, දිගින් දිගට කරන ගුණ වැනුම අම්හිරි දම් දෙසුමක තත්වයට පිරිහෙනවා මං බලාගෙනය. මෑතකදී මේ රටට ආ ශ්‍රී ලාංකික භික්ෂූන් දෙදෙනෙකු වර්ණනා කරන්නට නිවේදකයාට වචන නැති තරම් විය. මිහිඳු හාමුදුරුවන් සිරිලකට බුදු දහම හඳුන්වා දෙන්නට එන ගමන වාගේ එකක් විය යුතු යයි මම ඇත්තටම කල්පනා කළෙමි.

පිළිසඳරට දායක වන්නාට ස්තුති කිරීම හරියට දානයක් හමාර වී පින් අනුමෝදන් කිරීමක් වාගේ ය. තමා කරන්නේ වැඩ සටහනට ලැබෙන අගනා කාලය අපරාදේ නාස්ති කිරීමක් බව නිවේදකයා කල්පනා නොකරයි. අමුත්තා පෙරළා පින් දෙන ආකාරය ඊටත් වඩා විචිත්‍රය. සමස්ත ගුවන් විදුලි කාර්ය මණ්ඩලයටම ස්තුති නොකර ඔහු පස්ස බලන්නේ නැත. මේ පිට කසා ගැනීම් ශ්‍රාවකයන්ට නෑසෙන්නට පසුව කරගන්නට බැරිදැයි ප්‍රශ්න කළ යුතුය.

ශ්‍රී ලංකාවේ නිවේදකයන්ට, විශේෂයෙන් නිවේදිකාවන්ට ඉංග්‍රීසි වචන අතරින් පතට නොයොදා කතා කිරීම අසීරුය. මොවුනගේ ඉංග්‍රීසි දැනුම කොතරම්දැයි මම නොදනිමි. එහෙත් ඉංග්‍රීසි වචන යොදා කතා කිරීම එක්තරා විලාසිතාවක්ව පැවති යුගයක මව්බිමේ වාසය කළ මට එහි අමුත්තක්ද නැත. එහෙත් මේ රටේදී එය අවශ්‍ය නැත. අර වගේ අනවශ්‍ය තැනක ඉංග්‍රීසි රිංගවීම දුබලකමක් බව ඔවුන් වටහා ගත යුතුය.

මනා සැකැස්මකින් හා සූදානමකින් යුතුව, නිශ්චිත කාල සීමාවක අවසන් වන ආකාරයට, දිග් ගස්සන්නේ නැතිව ඉරිදාට ඉදිරිපත් කරන එක වැඩ සටහනක් ඇත. ඒ සඳහා සෑහෙන මහන්සියක් ද දරන බව පෙනී යයි. ඒ ප්‍රසන්න කුරුකුලරත්නගේ විමසුම ය. කණගාටුවට කරුණක් වනුයේ සමහර දාට ආසාවෙන් සවන් දිය හැකි එකම වැඩ සටහන එය පමණක්ම වීමය. ගණන් ගන්නවා නම් යයි සිතා එක අවවාදයක් දෙනු කැමැත්තෙමි. මා කලාතුරකින් ගුවන් විදුලියකින් කතා කළත්, වැඩ සටහනක් මෙහෙයවන්නට කිවහොත් මම ඒ වගකීම බාර නොගන්නෙමි. ඒ මට එය සාර්ථක ලෙස කරන්නට බැරි නිසාය. ගුවන් විදුලියේ වැඩ සටහන් කිරීමට ඇරයුම් තිබියදීත් ඉදිරිපත් නොවන්නන් ගැනත් මම දනිමි. තමන් එම රාජකාරියට නොගැලපෙන බව ඔවුහු අවබෝධ කරගෙන ඇත්තාහ. ඔවුන්ගෙන් ආදර්ශයක් ගත යුතු උදවිය එසේ කළ යුතු බවය මා අවවාදයක් හැටියට ඉදිරිපත් කරන්නේ.

ප්‍රජා නිවේදන වූ කලි, ප්‍රජා ගුවන් විදුලි සේවයක මූලික තැනක් ගන්නා බව අමුතුවෙන් කිව යුතු නොවේ. ඒ නිසාම එය විධිමත් ආකාරයට සකස් විය යුතුය. ඉදිරිපත් විය යුතුය. සියල්ලන්ම සතුටු කිරීමට අපහසු වුවත් කලින් දැනුම් දීමෙන් පිළිගත හැකි සාධාරණ පිළිවෙතක් අනුගමනය කිරීමට බැරි නැත. එබඳු අවස්ථාවක් සංවිධානය කරන සමිතියට හෝ පුද්ගලයාට ගුවන් විදුලියෙන් එය නිවේදනය කිරීමට සමහර විට ඉඩ දීම විශේෂ වරප්‍රසාදයක් හැටියටය, මා දකින්නේ. ගුවන් විදුලියෙන් කතා කිරීමේ රුචියක් ඇත්තන් ඒ අතර සිටින බවද පෙනෙයි. එහෙත් එබඳු විශේෂ සංග්‍රහයක් කිරීම අනෙක් සංවිධාන වලට, පුද්ගලයන්ට කරන අසාධාරණයකි.

ඒ සමඟම පෙන්වා දිය යුතු අනෙක් ගැටළුව (ගැටළුව ගුවන් විදුලිය බාරව ක්‍රියා කරන්නන්ටය) වනුයේ විවිධ උත්සව හා ප්‍රසංග සංවිධානය කරන්නන්ට තමන්ගේ අරමුණ හා කටයුතු විස්තර කිරීමේ අවසරය ගුවන් විදුලියෙන් සලසා දීමය. සමහරුන් එසේ කතා කිරීම සැබැවින්ම අවශ්‍යමද යන්න විටක මම මගෙන්ම ප්‍රශ්න කරමි. මෙහිලා ද සම්මත පිළිවෙතක් පවත්නා සැටියක් නොපෙනෙයි. මා මේ කරන්නේ අනවශ්‍ය කොන්දේසි පැනවීමක් නොවේ. මට එහි ලා කිසිදු තීරක බලයක් නොමැත. මෙය හුදෙක් අදහසක්, යෝජනාවක් පමණි. එබඳු සම්මත ක්‍රමයක් පවත්වා ගැනීම සුදුසු බව පමණක් කියමි.

ප්‍රජා ගුවන් විදුලි සේවාව කෙරෙහි එහි ශ්‍රාවක ප්‍රජාව තබන විශ්වාසය එහි ජනප්‍රියතාවට පමණක් නොව එම සේවාවෙහි චිර පැවැත්මට ද අත්‍යවශ්‍ය බව සිතමි.

ඩී.බී. කුරුප්පු